# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින **සහකාර පර්යේෂණ නිලධාරි** තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026.06.08** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකි ය).

## 1. සහකාර පර්යේෂණ නිලධාරි තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

### 1.1 කාර්ය ස්වභාවය

- පර්යේෂණවලට අදාළ දත්ත, තොරතුරු එක්රැස් කිරීම සහ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් පසුබිම් සටහන් සකස් කිරීම.
- පර්යේෂණ කටයුතුවලට අදාළ දත්ත පත්‍ර සහ සංඛ්‍යාලේඛන උපුටන සකස් කිරීම.
- පර්යේෂණ පැවැත්වීම සඳහා පර්යේෂණ නිලධාරීන් හට සහාය වීම.
- පර්යේෂණ කටයුතු සඳහා විවිධ පර්යේෂණ ලේඛන අධ්‍යයනය කිරීම සහ ඒවායින් අදාළ තොරතුරු උපුටා ගැනීම.
- ජාතික සහ ජාත්‍යන්තර සංසද, ජර්නල, සඟරා සහ පුවත්පත් වලට පර්යේෂණ පත්‍රිකා සකස් කිරීමේදී පර්යේෂණ නිලධාරීන්ට සහාය වීම.

### 1.2 වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 69,370-12x1,360- 85,690/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.115,000/- පමණ වේ).

### 1.3 වයස් සීමාව

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

### 1.4 සුදුසුකම්

1.4.1 **අධ්‍යාපන:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, නීතිය, කළමනාකරණය/ සංඛ්‍යානය යන ඕනෑම විෂයයකින් විශේෂ උපාධියක් ලබා තිබීම.

සහ

සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

1.4.2 **පළපුරුද්ද:** ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු රජයේ /පිළිගත් ආයතනයක වසර තුනක (03) පර්යේෂණ පළපුරුද්ද.

### 1.5 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතාව මඟිනි.

### 1.6 ඇගයීමේ පටිපාටිය

1.6.1 **ලිඛිත පරීක්ෂණය:** රැකියා කාර්යභාරය සහ වගකීම සම්බන්ධව අයදුම්කරුගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

1.6.2. **සම්මුඛ පරීක්ෂණය:** පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

1.6.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත නිර්ණායකයන් අනුව ලකුණු ලබා දෙනු ලැබේ: (මෙහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).)

| | නිර්ණායක |
|---|---|
| i. | අමතර අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් |
| ii. | සේවා පළපුරුද්ද |
| iii. | සේවා කාර්ය සාධනය (පර්යේෂණ පත්‍රිකා) |
| iv. | සන්නිවේදන කුසලතාවය හා භාෂා නිපුණත්වය |
| v. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව |

## 2. සේවා නියමයන් හා කොන්දේසි

**2.1** මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

**2.2** පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

**2.3** තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

**2.4** තෝරාගනු ලබන අයදුම්කරුවන් රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

**2.5** තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

**2.6** තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

**3.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (**මුල් පිටපත් නොවේ**) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**4.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**5.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**6.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**7.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

හංස අබේරත්න
වැ.බ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2026 මැයි මස 15 වැනි දින.